# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2112/6 – 2019 පෙබරවාරි 25 වැනි සඳුදා – 2019.02.25**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 (1) වැනි වගන්තිය යටතේ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පනවන ලද්දාවූ ද, අංක 2036/3 හා 2017.09.11 වැනි දින දරන *රජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද්දාවූ ද, 2017 අංක 216 හා 2017.08.28 වැනි දින දරන ආඥාවේ සවිස්තරව දැක්වෙන ඉඩම් කොටස් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත පැවරී තිබේ. එනමුත් මේ කියන ලද ඉඩම් කොටස්වල භුක්තිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් තවම භාරගෙන නැත. එබැවින්, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 39(1) වැනි වගන්තිය යටතේ මාහට පැවරී ඇති බලතල අනුව අංක 2036/3 හා 2017.09.11 වැනි දින දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ඉහත සඳහන් 2017 අංක 216 හා 2017.08.28 වැනි දින දරන ආඥාව මෙම නියමය මගින් ප්‍රත්‍යාදිෂ්ඨ කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/11/2016/යූඩීජ්/440.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: 6/3/1/516.
2019 පෙබරවාරි මස 12 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කිදෙල්පිටිය ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක කේජ්/එච්ආර්එන්/17/149 හා 2017.05.09 දිනැති ප්‍රගමන අනුරේඛනයේ දැක්වෙන පහත නම්වලින් හා ප්‍රමාණවලින් යුත් ඉඩම් කැබලිවලට මායිම්:

**01. කැබලි අක්ෂර 'බී' – ප්‍රමාණය: හෙක්. 0.0043 ක් පමණ**

උතුරට: නාකන්දල පාර සහ කොටගල වැව්ලි සමාගම හිමිකම් කියන තෙරුගල (සී කොටස); නැගෙනහිරට: කැබලි අක්ෂර සී; දකුණට: කැබලි අක්ෂර ඒ; බටහිරට: කැබලි අක්ෂර ඒ සහ කොටගල වැව්ලි සමාගම හිමිකම් කියන තේරුගල (සී කොටස).

**02. කැබලි අක්ෂර 'ඒ' – මීගහහේන වත්ත – ප්‍රමාණය: හෙක්. 7.0587 ක් පමණ**

උතුරට: මාබිලියා කන්ද පාර, කැබලි අක්ෂර ඒ, බී (මාර්ගය), සී සහ ඩී; නැගෙනහිරට: කැබලි අක්ෂර සී, ඩී සහ නාකන්දල පාර; දකුණට: නාකන්දල පාර, ප්‍රේමවතී වීරක්කොඩි සහ ප්‍රදීප් හේමචන්ද්‍ර හිමිකම් කියන අක්කර හැත්තෑදෙක ඉඩම, ඩේවිඩ් අමරතුංග හිමිකම් කියන අක්කර හැත්තෑදෙක ඉඩම, ගාමිණී වනිගතුංග හිමිකම් කියන අක්කර හැත්තෑදෙක ඉඩම, ඩබ්ලිව්. සිරිනෝනා හිමිකම් කියන අක්කර හැත්තෑදෙක ඉඩම, එච්. ඒ. විජේරත්න සහ තවත් අය හිමිකම් කියන අක්කර හැත්තෑදෙක ඉඩම සහ එච්. ඇසිලින් නෝනා සහ ජී. පුෂ්පකුමාර හිමිකම් කියන මාබිලියා කන්ද; බටහිරට: නාකන්දල පාර, ප්‍රේමවතී වීරක්කොඩි සහ ප්‍රදීප් හේමචන්ද්‍ර හිමිකම් කියන අක්කර හැත්තෑදෙක ඉඩම, ඩේවිඩ් අමරතුංග හිමිකම් කියන අක්කර හැත්තෑදෙක ඉඩම, ගාමිණී වනිගතුංග හිමිකම් කියන අක්කර හැත්තෑදෙක ඉඩම, ඩබ්ලිව්. සිරිනෝනා හිමිකම් කියන අක්කර හැත්තෑදෙක ඉඩම, එච්. ඒ. විජේරත්න සහ තවත් අය හිමිකම් කියන අක්කර හැත්තෑදෙක ඉඩම සහ එච්. ඇසිලින් නෝනා සහ ජී. පුෂ්පකුමාර හිමිකම් කියන මාබිලියා කන්ද සහ මාබිලියා කන්ද පාර.

03 – 504


1A – G29531 – 26 (2019/02)    ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*